# CEFTS හරහා HSBCක්‍රෙඩිට් කාඩ්පත් ගෙවීම් පියවීම

පහසුවෙන් හා සිත නිදහසින් යුතුව, ඔබේ HSBC ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා ගෙවීම් සිදුකරන්නට HSBC ගනුදෙනුකරුවන් වෙත ලබා දී ඇතිවිකල්පයන් පරාසයට තවත් අලුත්ම විකල්පයක් හඳුන්වා දී ඇත. ඒ අනුව, CEFTS හරහා වෙනත් බැංකු ගිණුම් වෙතින් සෘජුවම HSBC ක්‍රෙඩිට් කාඩ්පත් වෙත ගෙවීම් සිදු කිරීමේ හැකියාව දැන් ඔබට තිබේ.

ප්‍රතිලාභ

- වේගවත්ය

CEFTS ගෙවීම් එසැණින්ම HSBC වෙත යවනු ලබයි (බැර කිරීමේ කාලවේලාවන් පිළිබඳ සටහන බලන්න)

- මුදල් ඉතිරි වේ

එක් CEFTS ගනුදෙනුවක් මගින් පවරනු ලබන මුදල කොපමණ වුවත් ගනුදෙනුවක් සඳහා අයකරන උපරිම මුදල රු.30ක් පමණි. තෙවැනි පාර්ශ්වයේ ගෙවීම් මාර්ගයක් හරහා ඔබ සිදුකරන ගෙවීම රු.4,000ට වැඩි නම්, ඔබ විසින් ගෙවනු ලබන ගාස්තුවෙහි වෙනස භුක්ති විඳීමේ හැකියාව ඔබට ලැබෙනු ඇත.

- කාලය ඉතිරි වේ

මුදල් ආපසුගැනීමක් සිදුකර,එම මුදලත් රැගෙන HSBC ශාඛාවක් වෙත හෝ තෙවැනි පාර්ශ්වයේ ගෙවීම් මාර්ගයක් වෙත යාම හෝ ගෙවීම සිදුකිරීමට පෝලිමක රැඳීසිටීම හෝ අවශ්‍ය නොවේ. ඔබ සිටින තැනක සිට, ඔන්ලයින් මගින් ගෙවීම සිදුකළ හැකියි.

- පහසුවෙන් බලාගත හැකියි

ගෙවීම් සම්බන්ධයෙන් ඩිජිටල් වාර්තාවක් සහ තහවුරු කිරීමක් ඔබ වෙත ලැබේ.

- ආරක්ෂිතයි

ඔබට ජනයා ගැවසෙන ස්ථාන / තැන්පතු සිදුකිරීමට පෝලිම් වල රැඳීම ආදිය මගහැරිය හැකි බැවින් මෙන්ම විශාල වශයෙන් මුදල් රැගෙන යාමේ අවශ්‍යතාවක් ද ඇති නොවන බැවින්, සෞඛ්‍යමය වශයෙන්, විශේෂයෙන්ම COVID 19 තත්ත්වය යටතේ ඉතා ආරක්ෂිතය.

- පහසුයි

ඔබට පහසු අන්දමින් ඕනෑම වේලාවක ඕනෑම තැනක සිට මුදල් පැවරීම සිදුකළ හැකිය.

වෙනත් බැංකු වෙතින් මුදල් පැවරීම් සිදුකිරීම පහසුය. ඔබගේ කාඩ්පත සම්බන්ධයෙන් වන මාසික ගෙවීම පියවීම පිණිස ඔබ කළ යුත්තේ, පහත දක්වා ඇති සරල, පොදු පියවර අනුගමනය කිරීම පමණයි:

1. ඔබගේ අනෙක් බැංකු ගිණුමේ ඔන්ලයින් බැංකුකරණ සේවාවට පිවිසෙන්න.
2. පැවරීම් විකල්පය යටතේ ඇති 'CEFTS /Instant Transfer' තෝරන්න.
3. ශාඛාව වශයෙන්, 'HSBC Head Office / Fort' තෝරා, ඔබේ HSBC ක්‍රෙඩිට් කාඩ්පත් අංකය සහ ගෙවන මුදල ඇතුළත් කර, පැවරීම් තෝරන්න - එසැණින් ගෙවීම සිදු වේ!

වෙනත් බැංකු වෙත CEFTS ක්‍රෙඩිට් කාඩ්පත් ගෙවීම් සිදුකිරීමට ඉඩ සලසන CEFTS සාමාජික බැංකු / මූල්‍ය ආයතනය ලැයිස්තුව පහත පරිදි වේ:

පියවර සහිත මගපෙන්වුම සඳහා, කරුණාකර සාමාජික CEFTS මූල්‍ය ආයතන වෙත පිවිසෙන්න: https://www.hsbc.lk/credit-cards/cefts-settlement/#CEFTSmember

1. ඇක්සිස් බැංකුව
2. ලංකා බැංකුව
3. කාර්ගිල්ස් බැංකුව
4. කොමර්ෂල් බැංකුව
5. කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස්
6. DFCC බැංකුව
7. හබීබ් බැංකුව
8. හැටන් නැෂනල් බැංකුව
9. MCB බැංකු
10. ජාතික සංවර්ධන බැංකුව
11. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
12. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
13. පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන්
14. පබ්ලික් බැංකුව
15. සම්පත් බැංකුව
16. සෙංකඩගල ෆිනෑන්ස්
17. සෙලාන් බැංකුව
18. SDB

# නිතර අසන ප්‍රශ්න

**01.** වෙනත් බැංකුවක් හරහා මගේ ක්‍රෙඩිට් කාඩ්පත වෙත මා ගෙවීම් සිදුකරන්නේ කෙසේද?

බැංකු 18ක් (පහතින් දක්වා ඇති පරිදි) මගින්, අදාළ බැංකුවේ Online බැංකුකරණ සේවාව (අන්තර්ජාල බැංකුකරණ හෝ Mobile App) හරහා ඔබේ HSBC ක්‍රෙඩිට් කාඩ්පත වෙත ගෙවීම් යැවීමේ හැකියාව ඔබට ඇත.

**02. කොපමණ ගාස්තුවක් මාගෙන් අය කෙරෙනු ඇතිද?**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද, 2020 අංක 20 දරන ගෙවීම් සහ පියවීමේ ක්‍රමවේද පිළිබඳ චක්‍රලේඛයට අනුව, **Online** බැංකුකරණය හෝ **Mobile App** හරහා සිදුකරනු ලබන එක් **CEFTS** ගනුදෙනුවක් සඳහා ඔබගෙන් අය කළ හැකි උපරිම ගාස්තුව රු.30/-කි.

**03.** **මා විසින් ගෙවීම් සිදුකරන ලද මුදලේ වටිනාකමට මාගේ ක්‍රෙඩිට් කාඩ්පත වහාම භාවිත කිරීමේ හැකියාව මට තිබේද?**

ඔව්, ඔබගේ “භාවිත කළ හැකි ණය සීමාව” එසැණින්ම යාවත්කාලීන කෙරෙනු ඇති බැවින්, ඔබේ කාඩ්පත වහාම භාවිත කිරීමේ හැකියාව ඔබට ලැබේ.

**04.** **ගෙවීම් නියමිත දිනයේ, දවසේ ඕනෑම වේලාවක CEFTs ගෙවීම් සිදුකිරීමේ හැකියාව මට තිබේද?**

ගෙවීම් නියමිත දිනවල ප.ව. 5.30 දක්වා සිදුකරන ගෙවීම්, එදිනම සිදු කළ ගෙවීමක් වශයෙන් ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට බැර කෙරෙනු ඇත. ගෙවීම් සිදුකළ හැකි අවසන් වේලාවට පෙර ඔබේ ගෙවීම් සිදුකිරීම මගින් අයකිරීම්, ගාස්තු ආදී කිසිවක් ඔබේ කාඩ්පතෙන් අයවීම මගහරවා ගත හැකිය.

**05.** **HSBC ක්‍රෙඩිට් කාඩ්පත වෙත ගෙවීම් සිදුකිරීම සඳහා මා විසින් තෝරාගත යුතු විකල්පය කුමක්ද?**

ඉහත බැංකුවේ නම යටතේ පියවරෙන් පියවර දක්වා ඇති මගපෙන්වුමක් නොමැති නම්, කරුණාකර පහත පියවර අනුගමනය කරන්න.

මුදල් යැවීමේ විකල්පය සාමාන්‍යයෙන් “Transfer” විකල්පය යටතේ දැක්වෙන අතර, එසේ නොමැති නම්, ඇතැම් අවස්ථාවක එය “Bill Payment / Biller Management” විකල්පය යටතේ දැක්වෙනු ඇත.

- “Transfer”විකල්පය යටතේ නම්, ඇතැම් විටෙක ඔබට, fund transfer, transfer money, transfer to other bank / real time transfer / CEFTS transfer ආදී විකල්පයක් තේරීමට සිදුවනු ඇත.
- “Bill Payment” විකල්පය යටතේ නම්, ‘New Bill Payee’ එකතු කිරීමේ විකල්පය සොයන්න (උදා: ‘Add New Payee’ හෝ එකතු කිරීමේ ‘+’ලකුණක් සොයන්න).

මුදල් පැවරීම හෝ බිල්පත් ගෙවීම ආරම්භ කිරීම පිණිස, ඔබේ HSBC ක්‍රෙඩිට් කාඩ්පත පිළිබඳ විස්තර සුරකින ලද ආදායකයෙකු (Saved Payee) වශයෙන් සුරැකීමට (Save) ඔබට සිදුවිය හැකිය. සුරැකීමේ විකල්පය තිබේ නම්, ඔබේ HSBC ක්‍රෙඩිට් කාඩ්පත පිළිබඳ විස්තර සුරැකීම ඔබට පහසුවක් වනු ඇත්තේ, ඔබ ඊළඟ වාරයේ ගෙවීම් සිදුකරන විට ඔබේ කාඩ්පත පිළිබඳ විස්තර නැවත ඇතුළත් කිරීමේ අවශ්‍යතාවක් ඇති නොවනු ඇත.

**06.** **මුදල් පැවරීමේදී හෝ ආදායකයා (Payee) සුරැකීමේදී (Save) මා විසින් ඇතුළත් කළ යුතු හෝ තෝරාගත යුතු තොරතුරු මොනවාද?**

ඔබට, පැවරීම් හෝ බිල්පත් ගෙවීමේ විකල්පය භාවිත කිරීමට සිදුවෙයි නම් හෝ ආදායකයෙකු වශයෙන් HSBC කාඩ්පත් විස්තරය සුරැකීමට අවශ්‍ය කෙරෙයි නම්,

- හර ගිණුම - ඔබ විසින් ගෙවීම සිදුකිරීමට අදහස් කරන අනෙක් බැංකු ගිණුම තෝරන්න (හර ගිණුම)
- බැංකුවේ නම - "Hongkong and Shanghai Banking Corporation" හෝ "HSBC" තෝරන්න, නැතිනම් සොයාගන්න.
- බැංකු ශාඛාව - ඉල්ලා සිටියහොත්, පහත විකල්ප අතරින් එකක් සොයාගන්න, "Head Office / Fort / 001"
- Transfer to account or credit card යටතේ – Credit Card තෝරන්න
- Credit Card Number යටතේ– **ඉලක්කම් 16**කි න් යුත් ක්‍රෙඩිට් කාඩ්පත් අංකය ඇතුළත් කරන්න
- Amount යටතේ– ඔබ විසින් පැවරීමට අදහස් කරන මුදල

ගනුදෙනුව තහවුරු (Confirm) කරන්න.
ඔබගේ Online Banking / Mobile App පිවිසීමේ මුරපදය නැවත ඇතුළත් කිරීමට හෝ එක්වරක් පමණක් වන මුරපදය (One Time Password - OTP) වැනි තොරතුරු ඇතුළත් කරන ලෙසට ඔබෙන් ඉල්ලා සිටිය හැකිය. ඉල්ලා සිටින පරිදි තොරතුරු තිරයට ඇතුළත් කර, ගනුදෙනුව සම්පූර්ණයි / සාර්ථකයි (Transaction has been completed / Successful) යන බව තිරයෙහි දැක්වෙන තෙක්, ගෙවීම පිළිබඳ අවශ්‍ය කටයුතු දිගටම සිදුකරගෙන යන්න.

**සැලකිය යුතු කරුණු**

- **සිදුකරනු ලබන සියලු ගෙවීම් "භාවිත කළ හැකි ණය සීමාව" යටතේ එසැණින්ම කාඩ්පත් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට යාවත්කාලීන කෙරෙනු ඇත.**
- **ගෙවීම් පිළිබඳ පසුගිය විස්තර** ("ගිණුම්ගත දිනය") සහ ක්‍රෙඩිට් කාඩ්පත් 'ශේෂය'බැංකු වැඩකරන ඊළඟ දිනයේ දී යාවත්කාලීන කෙරෙනු ඇත.
- ගෙවීම් නියමිත දිනවල ප.ව. 5.30 දක්වා සිදුකරන ගෙවීම්, එදිනම සිදු කළ ගෙවීමක් වශයෙන් කාඩ්පත් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට බැර කෙරෙනු ඇත.
- බැංකු නිවාඩු දින වල හෝ සතිඅන්ත වල දී සිදුකරන ලද ගෙවීම් වල "ගිණුම්ගත දිනය", බැංකු වැඩකරන ඊළඟ දිනයේ දී පෙන්නුම් කෙරෙනු ඇත.